# පුරප්පාඩු

## ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව

## බලශක්ති අමාත්‍යාංශය

පහත දැක්වෙන තනතුර සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුර - අධ්‍යක්ෂ ජනරාල් HM 2-3**

- **සුදුසුකම්**

<u>බාහිර අයදුම්කරුවන් (1 හෝ 2)</u>

01. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යා/ ඉන්ජිනේරු විද්‍යා/ තනතුරට අදාළ වෙනත් විෂය ක්ෂේත්‍රයක විශේෂ උපාධියක් / පන්ති සාමාථර්යක් සහිත වෙනත් සාමාන්‍ය උපාධියක්

**සහ**

විද්‍යා/ ඉන්ජිනේරු /පරිපාලන / අදාළ විෂය ක්ෂේත්‍රයේ ලබාගත් ආචාර්ය උපාධියක් (PhD)

**සහ**

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු පරමාණුක බලශක්ති නියාමන, විකිරණ සුරක්ෂිතතාව හා ආරක්ෂාව පිළිබඳ, පරිපාලන හෝ නීති ආශ්‍රිත ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක සංස්ථා, මණ්ඩල හෝ පිළිගත් වෙළඳ ආයතනයක අවම වශයෙන් වසර 05 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

02. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලකින් ලබා ගත් විද්‍යා/ ඉන්ජිනේරු/තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වෙනත් විශේෂ උපාධියක් /පන්ති සාමාථර්යක් සහිත සාමාන්‍ය උපාධියක්

**සහ**

විද්‍යා/ ඉන්ජිනේරු /පරිපාලන / විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් පශ්චාත් උපාධියක්

**සහ**

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු පරමාණුක බලශක්ති නියාමන ආශ්‍රිත, විකිරණ සුරක්ෂිතතාව හා ආරක්ෂාව පිළිබඳ, පරිපාලන හෝ නීතිය ආශ්‍රිත සංස්ථා, මණ්ඩල හෝ පිළිගත් වෙළඳ ආයතනයක වසර 05 ක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ සේවා පළපුරුද්ද ඇතුළත් අවම වශයෙන් වසර 20ක කළමනාකරණ මට්ටමේ සේවා පළපුරුද්ද.

<u>අභ්‍යන්තර අයදුම්කරුවන්</u>

01. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම

**සහ**

බහුවිෂය ක්ෂේත්‍ර කණ්ඩායම් නායකත්වය ලබා දීම සහ මෙහෙයවීම පිළිබඳ සනාථ කළ නිපුනතාවයකින් යුක්ත වීම

**සහ**

මානව හා අනෙකුත් සම්පත් කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීමේ හා නිසි ලෙස යෙදවීමේ පළපුරුද්දක් තිබීම.

- **වයස් සීමාව**

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 නොවැඩි අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

- **වැටුප් පරිමාණය**

  රු. 173000/-, 4,850/-x 12 – 231,200/-

  **වැටුප**

  2025.01.01 දිනට මූලික වැටුප රු. 127,651/- (කළමනාකරණ සේවා චක්‍ර ලේඛ 01/2025 අනුව)

- **අනෙකුත් දීමනා**

  ජීවන වියදම් දීමනාව, ප්‍රවාහන සහ ඉන්ධන දීමනාව,වෘත්තීය දීමනාව, දුරකථන දීමනාව

- **රැකියා ස්වභවය**

  කොන්ත්‍රාත්

  සේවක අර්ථ සාධක අරමුදල හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් දායකත්වය හිමි වේ.

- **පොදු කොන්දේසි**

  01. ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.
  02. තනතුරේ රාජකාරී ඉටුකිරීමට හා රටේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා කායිකව හා මානසිකව යෝග්‍ය වීම
  03. විශිෂ්ඨ චරිතයකින් සමන්විත විය යුතු වීම.

- **තෝරා ගැනීම**

  ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**අයදුම්කරුවන් සඳහා පොදු අවශ්‍යතා**

- ශ්‍රී ලංකා පුරවැසියකු වීම
- තනතුරේ රාජකාරී ඉටුකිරීමට හා රටේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම හැකි වීම
- කායිකව හා මානසිකව යෝග්‍ය වීම
- විශිෂ්ඨ චරිතයකින් සමන්විත විය යුතු වීම

**අයදුම් කිරීම**

තනතුරට අදාල සුදුසුකම් සහ අනෙකුත් විස්තර සමඟ අයදුම්පත් ආකෘති පත්‍රය ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ **www.aerc.gov.lk** වෙබ් අඩවියෙහි සඳහන් කර ඇත. නියමිත ආකෘති පත්‍රයට අනුව සකසන ලද අයදුම්පත් ඥාතීන් නොවන නිදේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා ඇමතුම් විස්තර සහිතව සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතිකපත්වල ඡායා පිටපත් සමඟ 2025.10.31 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කළ යුතු අතර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය. දැනටමත් රාජ්‍ය අංශයේ/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වන්නේ නම් තම අයදුම්පත් අදාල ප්‍රධානීන්ගේ මාගර්යෙන් ඉදිරිපත් කළ යුතු ය.

සභාපති
ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව
977/18, නුවර පාර, බුලුගහ හංදිය, කැලණිය.

දුරකථන අංක - 011- 2987860, 011-2987859, 011-2987857
වෙබ් අඩවිය - www.aerc.gov.lk